

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය - පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තු වෙත ඉදිරිපත් කිරීම

நிறுவனத்தின் பெயர் நிருவாக மேன்முறையீடுகள் நியாய சபை-பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Administrative Appeals Tribunal-submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119 (4).

Chairman.
Justice Anil Gooneratne
Members.
Mr. A. Gnanathasan P.C.
Mr. G.P. Abeykeerthi

මගේ අංකය පරි/අභි/විනි/අවි/20 (IV)
எனது இல.
My Ref. No

ඔබේ අංකය
உமது இல
Your Ref. No

දිනය
திகதி 2023 අප්‍රේල් මස 21 දින
Date

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය
நிருவாக மேன்முறையீடுகள் நியாய சபை
ADMINISTRATIVE APPEALS TRIBUNAL

පාර්ලිමේන්තු අනු අංකය 183
ආයතනයේ නම: පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය (අධිකරණය ලෙස දක්වා තිබීම සදොස් ය.)

රාජ්‍ය ගිණුම් කාරක සභාව හඳුනාගන්නා ලද අඩුපාඩුව	**එම අඩුපාඩු නිවැරැදි කර ගැනීම සඳහා විසින් ආයතනය විසින් ගන්නා ලද ක්‍රියා මාර්ග හා වර්තමාන තත්ත්වය**
පළමු කොටස : 85:00	
I. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	2020 වර්ෂයට අයවැය ලේඛනයක් ඉදිරිපත් කරනු ලැබුවේ 2020 ඔක්තෝබර් මාසයේදී ය. එතෙක් අතුරු සම්මත ගිණුමක් මගින් වරින්වර මුදල් වෙන්කිරීමට මහ භාණ්ඩාගාරය කටයුතු කල හෙයින් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ නොහැකිව තිබුණි. කෙසේ වෙතත් ඉන්පසු 2021, 2022 හා 2023 වර්ෂයන් සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියල කර ඇත.
II. වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	අධිකාරය සඳහා එදිනෙදා අවශ්‍යවන ලිපිද්‍රව්‍ය වැනි දේ රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව මගින් සුළු ප්‍රමාණයන්ගෙන් මිලදී ගැනීම සිදුකරන බැවින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියල නොකරන ලදී. 2023 වර්ෂයට ද ලිපිද්‍රව්‍ය සඳහා වෙන්කර දී ඇත්තේ රු. 800,000/- පමණි.
III. රැස්කළ ආදායම් අදාල විධිවිධාන වලට අනුකූලව ආපසු ගෙවා නොතිබුණි. රැස්කර තිබුණු ආදායම් සෘජුවම ආදායමට බැරකර හෝ ඒවා තැන්පත් ගිණුමේ රඳවාගෙන මාසයකට වඩා අඩු කාලයක් ඇතුළත ආදායම් ගිණුමට බැරකර හෝ නොතිබුණි.	නිරීක්ෂණ මෙම අධිකාරයට අදාල නොවේ. ආදායම් ගිණුමක් සහ තැන්පත් ගිණුමක් අධිකාරයට නොමැත. අධිකාරයට ඇති එකම ආදායම ඡායා පිටපත් වෙනුවෙන් අයකරන ගාස්තු පමණකි. ඒවා දිනපතා බැංකුගත කර ගිණුම් සාරාංශ මගින් භාණ්ඩාගාරයට වාර්තා කරනු ලබයි.

කාර්යාලය
அலுவலகம்
Office
35, සිල්වා පටුමඟ, රාජගිරිය
35, சில்வா ஒழுங்கை, ராஜகிரிய
35, Silva Lane, Rajagiriya
Office Tel. : 011 - 2877685
Chairman Tel : 011 - 2866517
Secretary Tel : 011 - 2868702
Fax : 011 – 2868702 / 011 - 2869327
E - mail : adappealstribunal@gmail.com

IV.	2002.09.12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළියෙල කර විගණකාධිපති වෙත පිටපතක් සහිතව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර නැත.	කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ කාර්ය සාධන වාර්තාව පිළියෙල කිරීම ප්‍රමාද වූ අතර 2020 කාර්යසාධන වාර්තාව 2022 ජනවාරි මස 31 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත. විගණකාධිපති වෙත පිටපත් යවා ඇත.
V.	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බදවාගෙන තිබුණි.	නිරීක්ෂණ පිළි නොගනිමි. තනතුරු 20 ක් සඳහා පුරප්පාඩු පිරවීමට කටයුතු නොකළ බව විගණකාධිපති විසින් 2020 විගණන නිරීක්ෂණයන් හි දක්වා ඇත. රජයේ ප්‍රතිපත්තිමය තීරණ මත මෙම වර්ෂයේදී ද බදවා ගැනීම් කළ නොහැකිව ඇත.

දෙවැනි කොටස : 43:00

I.	ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි. ආයතනය පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	මේ පිළිබඳ මූලික කටයුතු සිදු කල ද මුදල් නොලැබීම මත එය කළ නොහැකිව ඇත. ඉහත කරුණ නිසා මෙම ප්‍රකාශය අදාල නොවේ.
II.	2018 ජනවාරි 24 දිනැති 02/2018 දරන රාජ්‍ය පරිපාලන විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියල කර නොතිබුණි.	ආයතනයේ මුළු කාර්ය මණ්ඩලයම 18 ක් වූ අතර, ඉන් 07 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බදවාගත් විශ්‍රාමිකයින් වේ. පුරප්පාඩු 13ක් ද පවතී. එබැවින් සේවකයන් පුහුණු කිරීමට හැකියාවක් නොමැති අතර මානව සම්පත් සංවර්ධන සැලැස්මක් ඵලදායි නොවන බැවින් එවැන්නක් පිළියෙල කර නැත.
III.	සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් එක් සේවකයෙකු සඳහා අවම වශයෙන් පැය 12 ක අතිරේක පුහුණුවක් නියම කර නොතිබුණි.	ඉහත කරුණ නිසා මෙම ප්‍රකාශය අදාල නොවේ.

IV සමස්ථ කාර්ය මණ්ඩලයම ඇතුළත්ව ගිවිසුම් සකස්කර ගිවිසුම්ගතව නොනිබුණි. මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමට ද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි. සැලැසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී නිබුණු පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.

ඉහත ඡේදය නිසා මෙම ප්‍රකාශය ආයතනයට අදාල නොවේ.

ලේකම්

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

කේ. බී. ඩී. එම්. පී. බී. දිසානායක
ලේකම්
පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය